# භාරතීය තර්කය හා ආයුර්වේදය

එස්. පී. මොල්ලිගොඩ*

තර්ක ශාස්ත්‍රය ස්වාධීන විෂයයක් ලෙස සංවර්ධනය වීමට පෙර ලෝක ඉතිහාසයේ මූලික ශාස්ත්‍ර තුළ එය ගැබ් වී තිබූ බව ට විවිධ සාක්ෂි හමුවේ. ආයුර්වේදය මෙන් ම වාස්තු විද්‍යාව, ජ්‍යෝතිෂය වැනි පැරණි භාරතීය ශාස්ත්‍රයන් ගොඩ නැංවීමේදී නිවැරදි චින්තනය මෙහෙයවීම සඳහා බෙහෙවින් උපකාරී වී ඇත්තේ තර්ක ශාස්ත්‍රය යි. දැනට ලොව පුරා විසිරී පවත්නා විවිධ ඥාන සම්භාරයේ මුල් බීජ විකසනයේ උරුමය මහා භාරතයට ලැබෙන බව බොහෝ උගතුන් ගේ මතය යි. බුද්ධකාලයට පෙර සිට ම තර්කය, වාදය, සම්භාෂා, පරිෂද් ආදී වචන භාවිතයේ යෙදී ඇති බව විවිධ භාරත ශාස්ත්‍ර අධ්‍යයනයෙන් පෙනේ. චරක සුශ්‍රැත ආදී වෛද්‍ය ග්‍රන්ථවල පවා මෙම වචන හමු වීමෙන් වැටහෙන්නේ එකල්හි පවා තර්කය පිළිබඳ ඥානය ගොඩනැඟී තිබූ බවයි. මෙම ග්‍රන්ථ බිහි වූ මුල් යුගය ක්‍රි. පූ. 8 වන සියවස පමණ විය හැකි බව විද්වත් මතය යි. ඉන්දියාවට අමතරව තර්ක ශාස්ත්‍රය බිහි කිරීම සඳහා දායක වූ රටවල් ලෙස සලකනුයේ ග්‍රීසිය, චීනය හා පර්සියාව යි. මෙම රටවල තර්ක ශාස්ත්‍ර ඉතිහාසය ද ක්‍රි. පූ. 400 - 500 ක් පමණ ඈතට දිවෙනු පෙනේ. විවිධ ශාස්ත්‍ර ගොඩනැඟීමේ දී තර්කය විවිධ ලෙස යොදා ගත්ත ද, තර්කය ශාස්ත්‍රීය විෂයයක් ලෙස ආරම්භ කිරීමේ ගෞරවය හිමි වන්නේ ග්‍රීසියටයි. ග්‍රීක ජාතිකයකු වූ ඇරිස්ටෝටල් (ක්‍රි. පූ. 384 - 322) විසින් තර්ක ශාස්ත්‍රයේ මූලික පදනම ඇති කරනු ලැබීය. ඔහු විසින් ලියන ලද On interpretations, Prior Analytics, Posterior Analytics, Topics and Sophistical Refutation නැමැති ග්‍රන්ථ මඟින් තර්ක ශාස්ත්‍රය පිළිබඳ මනා සාකච්ඡාවක් හා ස්ථිර පදනමක් ඇති කිරීමට ඔහුට හැකි විය. වර්තමානයේ දී තර්ක ශාස්ත්‍රය පහත සඳහන් පරිදි දියුණු වී ඇත.

1. සංවාක්‍යමය තර්ක ශාස්ත්‍රය (Syllogistic Logic)
   *(ඇරිස්ටෝටල්)*
2. ආකෘති තර්ක ශාස්ත්‍රය (Model Logic)
   *(විලියම් ඔක්කම්)*
3. ගණිතමය තර්ක ශාස්ත්‍රය (Mathematical Logic)
   *(ඩී. මෝර්ගන්, බුලේ, ජෙවනස්, ජොන්වෙන් ෆ්‍රේගේ රසල් සහ වයිට් හෙඩ්)*
4. සංකේත තර්ක ශාස්ත්‍රය (Symbolic Logic)
5. පරිගණක තර්ක ශාස්ත්‍රය (Computer Logic)

මෙසේ විවිධ කෝණ ඔස්සේ තර්කය බටහිර විෂයය ක්ෂෙත්‍රයේ විකාශනය වෙද්දී, භාරතීය තර්ක ශාස්ත්‍රය ඔස්සේ ද දාර්ශනික මත ගොඩනැඟිණි. ප්‍රධාන වශයෙන් භාරතීය තර්ක ශාස්ත්‍රය කොටස් දෙකකි.

1. වෛදික දර්ශනයට සම්බන්ධ තර්ක ශාස්ත්‍රය
   *(ගෞතමාචාර්යයන් ගේ න්‍යාය තර්ක ශාස්ත්‍රය)*
2. අවෛදික දර්ශනයන්ට සම්බන්ධ තර්ක ශාස්ත්‍රය
   *(බෞද්ධ, ජෛන, ලෝකායත, ආජීවක, අමරාවික්ඛෙප)*

න්‍යාය තර්ක ශාස්ත්‍රය පිළිබඳ විස්තර දැක්වෙන්නේ න්‍යාය ශාස්ත්‍රය, න්‍යාය බිංදු, න්‍යාය වාර්තිකා, න්‍යාය භාෂ්‍යය යන ග්‍රන්ථවල ය.

ක්‍රි. පූ. 479 - 438 කාලයේ දී චීනයේ විසූ මෝසු නැමැත්තකු විසින් මොහිවාදී තාර්කික නිකාය නමින් ක්‍රමයක් ගොඩනඟන ලදි. කොන්ෆියුසියස් දර්ශනයට විරුද්ධ ව ගොඩනැඟු මෙ ම දර්ශනය වැඩිදුරට වර්ධනය වී නැත.

---

*බී. ඒ. එම්. එස්. (ගෞරව) කොළඹ විශ්ව විද්‍යාලය
එම්.ෆිල් (දර්ශන හා මනෝවිද්‍යාව) පේරාදෙණිය විශ්ව විද්‍යාලය
කථිකාචාර්ය, දේශීය වෛද්‍ය විද්‍යායතනය.

## භාරතීය තර්ක ශාස්ත්‍රයේ ආරම්භය

බුද්ධ කාලයට පෙර සිට ම භාරතීය බුද්ධිමත්හු ලෝකය පිළිබඳ නිවැරැදි ඥානය තර්කය ඇසුරින් ගොඩනැඟීමට උත්සාහ ගත්හ. එස්. විද්‍යාභූෂණ ශාස්ත්‍රඥයා දක්වන පරිදි බ්‍රාහ්මණ වංශිකයන් පුදපූජා පවත්වන අවස්ථාවල දී තර්කය යොදා ගෙන ඇත. බ්‍රහ්මෝදයේ දී පුදපූජා පවත්වන කල්හි බ්‍රහ්මණයන් අතර සිදු කැරුණු කතා බහ මහාචාර්ය කේ. එන්. ජයතිලකයන් හඳුන්වනු ලබන්නේ " වාකෝවාක්‍ය " යන විශේෂිත යෙදුමෙනි. ඒවා අපෝහකයන් සේ සැලැකීමට හැකි බව එතුමා තව දුරටත් පෙන්වයි. රාධක්‍රිෂ්ණන් නැමැති දාර්ශනිකයා මෙය භාරතීය තර්ක ශාස්ත්‍රය නමින් හඳුන්වයි. එකල භාරතීය උගතුන් විවිධ ශාස්ත්‍රීය මාතෘකා පිළිබඳ ව වාද විවාද කළ බවට සාක්ෂි තිබේ. භාරතීය දර්ශනයේ " පරිෂද් " යන වචනය යෙදී තිබීම මෙයට එක් සාක්ෂියකි. " පරි " උපසර්ග පූර්වක " ෂද් " ධාතුවෙන් මෙ ම වචනය නිශ්පන්න වී තිබේ. to sit round, surrounding, be setting, an assembly, meeting, audience, council, යන වචනාර්ථයෙන් මෙහි දැක්වේ. සභාවක් තුළ කෙරුණු වාද විවාද මෙන් ම රාජ්‍ය අනුග්‍රහය සභාව ලබා ගත් අවස්ථා පිළිබඳ ව විවිධ දත්ත හමුවේ. එස්. විද්‍යාභූෂණ විද්වතා පෙන්වා දෙන පරිදි, ක්‍රි.පූ. 650 දී පමණ අන්වීක්ෂකී නමින් සඳහන් වී ඇත්තේ ද තර්ක ශාස්ත්‍රයකි. පසුව මෙය හේතු විද්‍යාවක් ලෙස හඳුන්වා දී ඇති බවද ඔහු පෙන්වයි. මෙම හේතු ශාස්ත්‍ර බිහි වීමට ද පරිෂද් මුල් වී ඇති බව ඔහු තවදුරටත් පෙන්වා දෙයි.විද්‍යාභූෂණ නැමැති විද්වතා දක්වන පරිදි " තන්ත්‍ර යුක්ත " නම් වූ පාරිභාෂික පදමාලාව කෞටිල්‍ය ගේ අර්ථ ශාස්ත්‍රයේ සඳහන් වේ.(ක්‍රි. පූ. 367) වර්තමානයේ භාවිත කෙරෙන, නාගාර්ජුන පාදයන් විසින් ප්‍රතිසංස්කරණය කළා යැයි සැලැකෙන සුශ්‍රැත සංහිතාවේ ද " තන්ත්‍ර යුක්ත " නමින් පරිච්ඡේදයක් වෙන් වී ඇත. "ධන්වන්තරි නම් වූ මහර්ෂිවරයා ඔහු ගේ සුවච ශිෂ්‍යයකු වන සුශ්‍රැත ඍෂිවරයා හට කියා ඇති පරිදි" යනුවෙන් එහි සඳහන් වේ. එහි සඳහන් පරිදි තන්ත්‍ර යුක්ති දෙතිසකි. ඒ මෙසේ ය. අධිකරණ, යෝග, පදාර්ථ, හේත්වර්ථ, උද්දේශ, නිර්දේශ, උපදේශ, අපදේශ, ප්‍රදේශ, අතිදේශ, අපවර්ග, වාක්‍යශේෂ, අර්ථාපත්ති, විපයයීය, ප්‍රසංග, ඒකාන්ත, අනේකාන්ත, පූර්ව පක්ෂ, නිර්ණය, අනුමත, විධාන, අනාගතාවේක්ෂණ, අතික්‍රාන්තාවේක්ෂණ, සංශය, ව්‍යාඛ්‍යාන, ස්වසංඥා, නිර්වචන, නිදර්ශන, නියෝග, විකල්ප, සමුච්චය, ඌහ්‍ය යනුවෙනි. මෙහි දැක්වෙන ශබ්ද සමූහයේ අර්ථ විනිශ්චය අනුව පැහැදිලි වන්නේ ඒවා පැහැදිලිව ම තර්ක ඥානය හා සම්බන්ධ බව යි. ආයුර්වේදය වැනි වෛද්‍යමය විද්‍යාවක් තර්කය වැනි විෂයයක් හා සම්බන්ධ කිරීම මෙහි දී සැලකිල්ලට භාජනය විය යුත්තකි. " තර්ක" යන්නෙහි අර්ථය වේමන් ශිවරාම්ගේ Sanskrit - English ශබ්ද කෝෂයේ දක්වා ඇත්තේ මෙසේ ය. Supposition, Conjecture, Guess, Reasoning, Speculation discussion, The science of Logic,wish Desire, Cause ආදී අර්ථ විවරණවලිනි. මෙ ම කරුණු වලින් ගම්‍ය වන්නේ වෛද්‍ය ඥානය, නිරතුරුව ම තාර්කික ඥානය හා සමවායව බැඳී පැවතිය යුතු බව යි. තන්ත්‍ර යුක්ති සියල්ල පහදා දීමෙන් අනතුරුව, එහි දක්වා ඇත්තේ ප්‍රදීප වැනි වූ මේ සියලු තන්ත්‍ර යුක්ති දැන ගැනීම බුද්ධිමත් වෛද්‍යවරයා ගේ යුතුකමක් බවයි. එබඳු වෛද්‍යවරයා ශ්‍රේෂ්ඨ වන බව ත් පිදීමට සුදුසු වන බවත් දක්වා තිබේ.

ද්වි ත්‍රිංශන් යුක්තයෝ හ්‍යේතාස් තන්ත්‍ර සාර ගවේෂණො මයා සම්‍යක් විනිහිතා :
මයා සම්‍යක් විනිහිතා : ශබ්දාර්ථ න්‍යාය සංයුතා
යො හ්‍යතා විධිමත් වෙත්ති - දීපි භූතාෂ්තු බුද්ධිමාන්
පූජාර්හෝ භිෂක් ශ්‍රේෂ්ඨ ඉති
ධන්වන්තරේර් මතං

ක්‍රි. ව. පළමු වන ශත වර්ෂයේදී " න්‍යාය සූත්‍ර " නමින් ද හඳුන්වා ඇත්තේ තර්ක ශාස්ත්‍රය බව උගතුන් ගේ පිළිගැනීමයි. එමෙන් ම තර්කය යන වචනය සඳහා න්‍යාය ශාස්ත්‍රය, තර්ක විද්‍යා, ප්‍රමාණ ශාස්ත්‍රය, ආන්වික්ෂිකීය තත්ත්ව ශාස්ත්‍රය, තර්ක විද්‍යා, වාදාතර්ච යන පද භාවිත වී ඇති බව පෙනේ.

බොහෝ උගතුන් " න්‍යාය " යන්න තර්කය හා සම වන පදයක් සේ සැලකුව ද " න්‍යාය " යනු තර්ක ශාස්ත්‍රය නො වන බව පණ්ඩිත බද්දේගම විමලවංශ හිමියන් ගේ අදහසයි. ප්‍රමාණ ද්වාරයෙන් අර්ථ පරීක්ෂණය " න්‍යාය " යන්නෙහි අදහස බව එහිමියන් සඳහන් කරයි. තර්කයක තේරුම ලබාදීම සඳහා න්‍යාය යන වචනය කෝෂ ග්‍රන්ථවල භාවිත වී තිබේ. එ සේම එහි න්‍යාය ක්‍රම දර්ශන බිහිවීමට හේතු වී තිබේ. තර්කය හා දර්ශනය බොහෝ විට එක්ව බිහි වී ඇති බව මෙ ම කරුණු අනුව නිගමනය කළ හැකිය. භාරතයේ මෙන් ම චීනයේ හා ග්‍රීසියේ ද සමකාලීනව දර්ශන හා තර්කය පිළිබඳ මතවාද බිහි වී ඇත.

දර්ශනය යනු බොහෝ විට තර්කානුකූල වූත්, ශාස්ත්‍රීය වූත්, බුද්ධිගෝචර වූත් ඉගැන්වීමක් වන හෙයින් ඒ තුළ නිරන්තරව ම තර්කය බැඳී පවතින බව පෙනේ.

භාරත දර්ශනවාදය හා තර්කයට අනුව සත්‍ය ඥානය ලබා ගැනීම සඳහා මඟ පෙන්වන්නා දර්ශනවාදියා ය. බුද්ධිවර්ධන ප්‍රකරණ දශකයට අනුව, ඥානය මෙහෙයවා ආයුර්වේද වෛද්‍යවරයා කටයුතු කළ බව චරක සංහිතාවේ දැක්වේ.

" . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . භිෂජාං ඥානාර්ථමුපදේක්ෂ්‍යාමඃ

ඥාන පූර්වකං හි කර්මණාං සමාරම්භං
ප්‍රශංසන්ති කුශලිඃ ඥාත්වා හි කාරණ-
කරණ,කාර්යයෝනි, කාර්ය, කාර්යඵලානුබන්ධ
දේශ, කාල, ප්‍රවෘත්ත්‍යුපායාන් සම්‍යග්හි
නිවර්තමාන ඃ කාර්යාභිනිර්වෘත්තා ..............."

චරක / විමාන / 8 /68

බොහෝ විට තර්කය උපයෝගී කර ගත යුත්තේ ඉන්ද්‍රිය ගෝචර දේවල්වලට වඩා බුද්ධි ගෝචර කරුණුවල නිවැරදිතාවය සෙවීම සඳහා ය. ආයුර්වේද වෛද්‍යාවරයා විසින් චිකිත්සාවේදී ඉන්ද්‍රිය ගෝචර තත්ත්වයන් බුද්ධිය මෙහෙයවීම තුළින් යම් යම් නිමානයන්ට භාජනය කළ යුතු වේ. මේ සඳහා ප්‍රමාණ ශාස්ත්‍රයක් වූ භාරතීය තර්ක ශාස්ත්‍රයේ ආභාසය ආයුර්වේද ශාස්ත්‍රය නොමඳව ලබා ගෙන ඇති බව ආයුර්වේද ග්‍රන්ථ පරිශීලනයෙන් පෙනේ.

භාරතීය තර්ක ශාස්ත්‍රය ගොඩනැංවීමෙහිලා න්‍යාය දර්ශනය බෙහෙවින් උපකාරී වී ඇත. න්‍යාය ශාස්ත්‍රයේ දැක්වෙන ප්‍රමාණ ප්‍රමාණාර්ථයෙන් යෙදී නැත. එහි සඳහන් ප්‍රමාණ තත්ත්ව ඥාන ලෙස හැඳින් වේ. වෛශේෂිකයන් මෙය හඳුන්වන්නේ " යථාර්ථානුභව, නමිනි. න්‍යාය බින්දුවෙහි මෙය සම්‍යග්ඥානය නමින් හඳුන්වයි. තථ විතථ, අනඤ්ඤථ යන නම් වලින් පාලි සාහිත්‍යයේ මෙය සඳහන් යැයි න්‍යාය බිංදු දීපිකාවේ සඳහන් වේ. " ප්‍රමා " නම් වූ තත්ත්වාවබෝධයට ඉවහල් වන්නා වූ මාර්ගය ප්‍රමාණය යි.

" ප්‍රමායඃ කරණං ප්‍රමාණම් " යනුවෙන් එය සඳහන් වේ. තර්ක නැමැති වාද විද්‍යාව පරිණාමයට පත්වීම තුළින් භාරතයේ න්‍යාය ශාස්ත්‍රය බිහි විය. නමුත් භාරතීය තර්ක ශාස්ත්‍රයේ ආරම්භය බටහිර තර්කයේ ආරම්භයට වඩා වෙනස් බව පෙනේ. භාරතයේ විවිධ දාර්ශනික සම්ප්‍රදායන් විවිධ මතිමතාන්තර පදනම් කරගෙන ඒවා නිෂ්ප්‍රභ කිරීම හෝ සනාථ කිරීම සඳහා තර්කය භාවිත කර ඇත. බෞද්ධ තර්ක වුවද බිහි වී ඇත්තේ එකල සමාජයේ පැවැති විවිධ මතවාද බිඳ හෙළීම සඳහා පිළිතුරු ලබාදීමට බෞද්ධ භික්ෂුව ඉදිරිපත් වූ හෙයිනි. එබැවින් භාරතීය තර්කය පිළිබඳ කථා කිරීමේදී න්‍යාය, වෛශේෂික, සාංඛ්‍ය, ජෛන, බෞද්ධ, සංශයවාදී, ලෝකායන, වේදාන්ත ආදී සියලු දර්ශන ඒකරාශී කිරීම් කළ යුතු බව පෙනේ.

භාරතීය තර්ක ශාස්ත්‍රය ශුද්ධ තර්ක ශාස්ත්‍රයක් පමණක් නො වේ. ඥාන විභාගාත්මක, මනෝ විද්‍යාත්මක දාර්ශනික විග්‍රහයක් ද එයට ඇතුළත් වේ. එබැවින් මෙය හුදු සාම්ප්‍රදායික රාමුවක කොටු වී නැති බවත්, පුළුල් පරාසයක් තුළ විහිදී ඇති, බුද්ධි ගම්‍ය වූ ද ප්‍රායෝගික වූ ද විෂයයක් සේ හඳුන්වා ඇත. මහාචාර්ය වීරසිංහයන්, භාරතීය තර්ක ප්‍රවේශය නැමැති ග්‍රන්ථයෙන් පෙන්වා දෙන පරිදි භාරතීය තර්ක ශාස්ත්‍රයේ ඓතිහාසික විකාශය උපනිෂද් දාර්ශනික සම්ප්‍රදායෙන් බිහි වී ඇත.

නූතන තර්ක ශාස්ත්‍රය භාරතීය ශාස්ත්‍රය හා සැසඳීමේ දී, තාර්කික වශයෙන් විවිධ වෙනස්කම් ඇති බව පෙනේ. බටහිර තර්ක ශාස්ත්‍රයේ පියා වශයෙන් ඇරිස්ටෝටල් හඳුන්වා ඇතත් ඉන්දීය තර්ක ශාස්ත්‍රයේ මූලාරම්භකයා හඳුනා ගැනීම අපහසුයි. ඇරිස්ටෝටල් ගේ තාර්ක ශාස්ත්‍රය නිගාමී හා උද්ගාමී ලෙස අංශ දෙකකි. නිගාමී තර්ක ශාස්ත්‍රය රීතීන්ට ශුද්ධ රූපික බවක් ගනු ලබන නිසා රූපක තර්ක ශාස්ත්‍රය ලෙස හඳුන්වයි. එහෙත් උද්ගාමී තර්ක ශාස්ත්‍රය නිරීක්ෂණ පරීක්ෂණ ඔස්සේ නිගමන කරා පැමිණේ. එහි දී බාහිර ලෝකය පිළිබඳ ව අවධානය යොමු කරයි. භාරතීය තර්ක ශාස්ත්‍රයට ඥාන විභාගය, මනෝ විද්‍යාව හා වෙනත් විග්‍රහයන් ද ඇතුළත් වේ. භාරතීය තර්කයේ විස්තර වන අනුමාන ප්‍රමාණය බටහිර තර්කයේ ද දක්නට ලැබේ. සංවාක්‍ය යටතේ මෙය විස්තර වේ. අනුමානය ආදී තාර්කික ව්‍යුහයන්ට රූපික අර්ථ කථන ලබා දීමෙන් මේ පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් ලබා ගැනීම හැකි වේ. භාරතීය තර්ක ශාස්ත්‍රයේ දී ප්‍රත්‍යක්ෂ, අනුමාන, අනුපලබ්ධි, කාරණ, ව්‍යප්ති, හේත්වාභාස, ආදිය ප්‍රධාන කරුණු වශයෙන් සැලකීමට

පුළුවන. උපමානය යනු සාදෘශ්‍යය ඇසුරින් ගොඩනැගෙන ඥානයයි. ජෛන හා බෞද්ධ තාර්කිකයෝ උපමානය වෙන ම ප්‍රමාණයක් ලෙස සලකා නැත. බොහෝ විට එය අනුමාන, උපමාන ශබ්ද යන ප්‍රමාණයන් ගෙන් සැදුණු පරෝක්ෂයක් ලෙස සලකා ඇත. දිඩ්නාග ස්ථවිරයන් එය ප්‍රත්‍යක්ෂයේ ම කොටසක් ලෙස සැලකූ බව පෙනේ. න්‍යාය, මීමාංසා වේදාන්ත ආදියේ එය වෙන ම ප්‍රමාණයක් ලෙස සලකා ඇත. ආයුර්වේද ශාස්ත්‍රයේ ද උපමානය ප්‍රමාණයක් ලෙස සලකා ඇති අයුරු විවිධ උපමා ඇසුරින් වටහා ගත හැකි ය. ආයුර්වේද චිකිත්සාවේ වාත ව්‍යාධි අධිකාරයෙහි විස්තර කෙරෙන ධනුස්තම්භ රෝගයේ ලක්‍ෂණ විස්තර කිරීමේ දී එය නැමුණු දුන්නක හැඩරුව ගන්නා බව දක්වයි. එම මොහොතේ එලෙස නැමුණු රෝගියකු නො දුටුව ද පසු ව එ වැනි රෝගියකු දුටු කල උපමානය ඇසුරින් එම රෝගය පිළිබඳව වටහා ගැනීමට හැකියාව ලැබේ.

ධනු : ස්තුලයං නමේද් යස්තු
ස ධනු : ස්තම්භ සංඥාක :

බටහිර උද්ගාමී තර්කයේ හැදෑරෙන සාදෘශ්‍යය හා උපමානය අතර සම්බන්ධකම් මෙන් ම වෙනස්කම් දැකිය හැකි ය. උද්ගාමී අනුමානයෙහි, සාදෘශ්‍යය අනුමානය වශයෙන් විස්තර වන කොටස් ද තිබේ. භාරතීය උපමානය විශේෂයෙන් ම වස්තුවක් හඳුනා ගැනීම සඳහා අවධානය යොමු කරවයි. එය සාමාන්‍ය කරණයට තුඩු නො දෙන, සාදෘශ්‍යයේ සීමිත උපයෝගිතාවකි.

භාරතයේ තර්ක ශාස්ත්‍රයේ " ධන ප්‍රමාණ " සඳහා සුවිශේෂී ස්ථානයක් හිමි වී තිබේ. ප්‍රමාණ (Means of Knowledge) පිළිබඳ ව " තර්ක සංග්‍රහය " පහත පරිදි විස්තර කරයි.

" යථාර්ථානුභාවඃ ප්‍රමා - තත් සාධනංච ප්‍රමාණා " චරකයේ ප්‍රමාණ හඳුන්වන්නේ "පරීක්‍ෂා" යන විශේෂණ පදයෙනි. සුශ්‍රැත සංහිතාව " විශේෂ විඥාන " යන පද ප්‍රමාණ සඳහා භාවිත කර ඇත.
භාරතීය දර්ශනයන් පිළිගත් ප්‍රමාණ පිළිබඳ සටහන් පහත වගුවේ දැක්වේ.

| දර්ශනය | | | පිළිගත් ප්‍රමාණය | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| චාරවාක | ප්‍රත්‍යක්ෂ | | | | | | | | |
| වෛශේෂික | " | අනුමාන | | | | | | | |
| බෞද්ධ | " | " | | | | | | | |
| න්‍යාය (අ) | " | " | ශබ්ද | | | | | | |
| සාංඛ්‍ය | " | " | " | | | | | | |
| යෝග | " | " | " | | | | | | |
| න්‍යාය(ආ) | " | " | " | උපමා | | | | | |
| ප්‍රභාකර මීමාංශා | " | " | " | " | අර්ථා පත්ති | | | | |
| භට්ට මීමාංශා | " | " | " | " | " | අභාව | | | |
| වේදාන්තය | " | " | " | " | " | " | | | |
| පෞරාණික | " | " | " | " | " | " | සම්භව | ඓතිහාස | |
| තාන්ත්‍රික | " | " | " | " | " | " | " | " | චේෂ්ටා |

භාරතීය දර්ශනයන්හි පොදු වශයෙන් " ප්‍රමාණ " නවයක් පිළිබඳව විස්තර කළ ද, ආයුර්වේද දර්ශනය ඒ සියල්ල පිළිබඳව විචක්ෂණ භාවයෙන් කටයුතු කර, ආයුර්වේද වෛද්‍ය ශාස්ත්‍රයට අදාළ වන්නා වූ ප්‍රමාණ කෙරෙහි පමණක් යුක්ති පූර්වක ව වෛද්‍ය දැනුම පිළිබඳ තමා ගේ අවබෝධය මෙන් ම, වෛද්‍ය ශිෂ්‍යයා ගේ අධ්‍යාපනය හා අවබෝධය සැලසෙන අයුරින් මෙ ම ප්‍රමාණ තෝරාගෙන ඇති බව ද දැකිය හැකි යි.

ද්වි විධ මේව බලු සර්වං සච්චා'සච්ච තස්‍ය චතුර් විධා
පරීක්ෂා ආප්තෝපදේශඃ ප්‍රත්‍යක්ෂම්, අනුමානං යුක්තිශ්චේති (9)

(ලොවෙහි ඇති සියල්ල සත් අසත් යනුවෙන් දෙ පරිදි වේ. ඒ සියල්ල (දැන ගැනීම) සඳහා අවශ්‍ය පරීක්ෂා (ප්‍රමාණ) හතරකි. ආප්තෝපදේශ, ප්‍රත්‍යක්ෂ, අනුමාන, යුක්ති යනුවෙනි.)

ඉහත විස්තර කිරීමට අමතරව චරක සංහිතාවේ විමාන ස්ථානයේ රෝග පිළිබඳව විශේෂ දැනුම ලැබීම සඳහා ප්‍රමාණ තුනක අවශ්‍යතාව සඳහන් කර තිබේ. ඉහත දී " යුක්තිය " ප්‍රමාණයක් ලෙස දක්වා තිබුණ ද, මෙහි යුක්තිය පිළිබඳව සඳහන් වී නැත.

ත්‍රිවිධං බලු රෝග විශේෂවිඥානං භවති ; තද්‍යථා
ආප්තෝප දේශඃ ප්‍රත්‍යක්ෂම්, අනුමානං චේති(10)

රෝගය පිළිබඳ ව සම්‍යක් දැනුම ලැබීම මඟින් රෝගියාට සැලසෙන්නේ නොමඳ සුවයකි. ඒ සඳහා විශේෂයෙන් ප්‍රමාණ 3 ක් උපයෝගි කර ගත යුතු බව චරක සංහිතාව තව දුරටත් දක්වා තිබේ

ආප්තතශ්චෝපදේශේන - ප්‍රත්‍යක්ෂිකරණේනච,
අනුමානේනච ව්‍යාධීන් - සම්‍යග් විද්‍යාද් විචක්ෂණ ඃ(11)

රෝගය පිළිබඳව ත්‍රිවිධ ඥානය ලැබීම සඳහා (හේතු, ලිංග, ඖෂධ) ගුරු උපදේශයේ වැදගත්කම පිළිබඳ දක්වන චරක එය ආප්තෝපදේශය ලෙස සැලැකිය යුතු බවත්, ඉන්ද්‍රිය ගෝචර දැනුම ප්‍රත්‍යක්ෂය ලෙස ගත යුතු බවත් තව දුරටත් දක්වා ඇත.

සර්වරෝග විශේෂාණාං - ත්‍රිවිධං ඥාන සංග්‍රහම්
යථා චෝපදිශන්ත්‍යාප්තාං - ප්‍රත්‍යක්ෂං ගෘහ්‍යතේ යථා ඃ

මෙලෙස රෝග පිළිබඳ ව, ප්‍රමාණ අනුසාරයෙන් තත්ත්ව ඥානයෙන් ලබා නො ගෙන, රෝග සිරුරට පිවිසීම මඟින්, නිසි ප්‍රතිකාරයක් ලබා දීමට වෛද්‍යවරයා අසමත් වන බව තව දුරටත් චරක සංහිතාව සඳහන් කරයි. ප්‍රත්‍යක්ෂ ප්‍රමාණය වෛද්‍යවරයාට බෙහෙවින් ප්‍රයෝජනවත් වන බව ආයුර්වේද ශාස්ත්‍රයේ මෙලෙසින් විස්තර කර තිබේ.

ආයුර්වේද පිළිගන්නා ප්‍රමාණ අතුරින් " අනුමාන " (Inference) ප්‍රමාණයට හිමිවනුයේ ද සුවිශේෂී ස්ථානයකි. ප්‍රත්‍යක්ෂ ප්‍රමාණයෙන් ගෝචර නො වන්නා වූ දැනුම සඳහා අනුමාන ප්‍රමාණය යොදා ගැනීමට ආයුර්වේද ශාස්ත්‍රයේ උපදෙස් දක්වා තිබේ. වෛද්‍යවරයාට ඇවැසි රෝග නිදාන රෝග ලක්ෂණ (ලිංග, හා ඖෂධ පිළිබඳ ඥානය අනුමාන ප්‍රමාණයෙන් ලබා ගැනීමට හැකි වේ) අනුමාන යනු ප්‍රත්‍යක්ෂයේ සම්බන්ධය (අවිනාභාවය) එල්ල කොට ඇති සකාරණ චින්තනයයි.

| | | |
|---|---|---|
| අනු | - | පශ්චාත් |
| මාන | - | ඥාන |

ලබා ගන්නා වූ දැනුම මත තවත් ඥානයක් ගොඩ නැඟීම අනුමාන ප්‍රමාණයෙන් සිදු කරයි. රෝගියාගේ කුසගින්නේ ප්‍රමාණයෙන් දිරවීමේ ශක්තිය ද, ශරීර ශක්තිය, වෙහෙසීමේ ශක්තියෙන්ද, පංච ඉන්ද්‍රියන් ගේ

ස්වභාවය ඉඳුරන් ගේ ග්‍රහණ ශක්තිය අනුව ද, විශිෂ්ට වූ ඥානය රෝගියා ගේ පැවැත්මෙන් ද ඉන්ද්‍රිය ඥානය අවබෝධ කර ගන්නා වූ ස්වභාවයෙන් මනසේ ස්වරූපය ද, නො වැටහීමෙන් මෝහයේ ස්වරූපය ද, අනුන්ට කෙරෙන පීඩාවෙන් කෝපයේ ස්වරූපය ද, දීන බවින් ශෝකවත්බව ද, විශේෂිත සතුට සංගීතයෙන් ද, මඳ වූ සතුට ප්‍රීතියෙන් ද, විෂාදයෙන් බියපත් වූ බව ද, විෂාදයට පටහැනි දෙයින් ධෛර්යයමත් බව ද, කටයුතු ඇරඹීමේ උත්සාහයෙන් වීර්යයමත් බව ද, අචල හෙවත් ස්ථිර බව අභ්‍රාන්තියෙන් ද, ශ්‍රද්ධාව අභ්‍යර්ථනයෙන් ද, ග්‍රන්ථ ආදිය ධාරණය කරන ස්වරූපයෙන් නුවණ පිළිබඳ ව ද, සැමරීමෙන් ස්මෘතියේ ස්වභාවය ද, හැසිරීමේ ස්වභාවයෙන් ලැජ්ජාවේ ආකාරය ද, වස්තු විෂයක සහජ රාගය, අනවරත ශීලනයෙන් ද, කපටිබව ඉදිරි කාලයේ ඇතිවන ඵල විපාකයෙන්ද, බුද්ධිය අචංචලත්වයෙන් ද, හඳුනාගත හැකිය. (13)

මෙම කරුණු කෙරෙහි පැහැදිලි අවබෝධයක් ලැබීමට අනුමාන ඥානය ප්‍රයෝජනවත් වන ආකාරය චරක සංහිතාවේ විස්තර කර ඇත. එසේ ම සැඟවුණු ලකුණු ඇති රෝග සාත්ම්‍ය, අසාත්ම්‍ය දෙකින් ද, දෝෂ ප්‍රමාණයේ විභේදනය අපථ්‍ය සේවනයේ ලොකු කුඩා භේදයෙන් ද, ජීවනය පිළිබඳ හානිය මරණ සූචක ලකුණු වලින් ද, එළඹ සිටි යහපත්කම ශ්‍රෙයස්කර මාර්ග අනුෂ්ඨානයෙන් ද, නිර්මල වූ සත්ව ගුණය රාග ද්වේෂ විකාරයන්ගේ අභාවයෙන් ද දැනගත හැකි බව චරක සංහිතාව තව දුරටත් පෙන්වා දෙයි.

ආප්තෝපද්ශ ප්‍රමාණය ද ආයුර්වේද ශාස්ත්‍රයේ දී බෙහෙවින් වේ. දර්ශනවාදීහු ආප්තෝපදේශ ශබ්ද නමින් ද හඳුන්වයි. ආප්තෝපදේශ ලබා දෙන පුද්ගලයා ආප්තයා නමින් හඳුන්වනු ලබන අතර ආප්තයා තුළ තිබිය යුතු සුවිශේෂ ගුණ ආයුර්වේද ශාස්ත්‍රයේ වෙන ම දක්වා තිබීම ද විශේෂයෙකි. චරක විමාන ස්ථානයේ දැක්වෙන පරිදි රෝග, රෝගයට හේතු, වාතාදි දෝෂ ස්වභාවය, සිරුරේ අවයව හා මනස, රෝග පීඩා, ලක්‍ෂණ, ශබ්ද, ස්පර්ශ, රූප, රස, ගන්ධ, උවදුරු, රෝගයේ, අඩුවීම්, වැඩිවීම්, ඖෂධ යෝග ආදිය ආප්ත වචනයෙන් දැන ගත හැකි ය.

තත්‍රෛදමුපදිශන්ති බුද්ධිමන්තඃ - රෝග මේකෛක මේවං
ප්‍රකෝපණ මේවංයෝනි මේව මුත්ථාන මේව මාත්මාන, මේවමධිෂ්ඨාන
මේවං වේදන මේවං සංස්ථාන මේව ශබ්දස්පර්ශ
රූප රස ගන්ධ මේව මුපද්‍රව මේවං වෘද්ධිස්ථාන ක්‍ෂය සමන්විත ......(14)

ඉහත කරුණු සැලකිල්ලට ගැනීමේ දී වැදගත්වන අනෙක් ප්‍රධාන කරුණ වන්නේ "ආප්තයා" යනු කුමන පුද්ගලයෙක් ද යන්න වටහා ගැනීමට ඇති අපහසුතාව යි. ලෝකයේ වෙනස් නො වන ධර්මතාවන්, නිශ්චිත ව ප්‍රකාශ කිරීමේ හැකියාව පවතින්නේ ආප්තයන් හට වීම මෙහි දී විශේෂ වේ. ආප්ත වාක්‍ය වෙනස් නො වන බව ආප්තයා යනු කවුරුන්ද යන්න වටහා ගැනීමෙන් නිගමනය කළ හැකියි. ආයුර්වේද ශාස්ත්‍රයේ දැක්වෙන පරිදි ආප්තයා යනු තපස් ඥාන බලයෙන් යුක්ත රජස් හා තමස් යන මානසික දෝෂ පහ කරන ලද, තුන් කාලය පිළිබඳව ඥානය ඇති, ශිෂ්ටවූ ද, ප්‍රඥාවන්තවූ ද, පුද්ගලයෙකි.

රජස්තමෝභ්‍යාං නිර්මුක්තාස් - තපෝඥාන බලේන යේ
යේෂාං ත්‍රිකාලමමලං - ඥානමව්‍යාහතං සදා :
ආප්තාඃ ශිෂ්ටා විබුද්ධාස්තේ - තේෂාං වාක්‍යමසංශයම්
සත්‍යං වක්ෂ්‍යන්ති තේ කස්මා ද සත්‍යං නීරජස්තමාඃ

ච/සු/11/18-19

මෙම කරුණු අනුව පෙනී යන්නේ ලෝකය පිළිබඳ ව හෝ වෙනත් වෛද්‍ය දත්ත පිළිබඳ ව හෝ ලබා ගන්නා වූ දැනුමේ ස්ථිරසාර බව මෙ ම ආප්ත ගුණ හා බැඳී පවතින බව යි. ආයුර්වේද දර්ශනයට අනුව මේ වාද නියම ප්‍රමේය ආදි සංකල්පවල විචල්‍ය බව පිළිබඳ ව ද ආප්ත ගුණ ඇසුරින් නිගමනයකට බැසීමට පුළුවන.

භාරතීය තර්ක ශාස්ත්‍රයේ සුවිශේෂී අංගයක් වූ වාදය පිළිබඳ ව ද ආයුර්වේද ශාස්ත්‍ර ග්‍රන්ථාගත ව විවිධ කරුණු හමුවේ. වාදය ආයුර්වේද චිකිත්සාවට උපයෝගිකර ගත හැකි ආකාරය මෙහි ද සලකා බැලීම වැදගත් වේ. භාරතීය දර්ශන හා තර්කය පිළිබඳ ව අධ්‍යනය කිරීමේ දී පෙනී යනුයේ වාදය පිළිබඳ විශේෂ කරුණු න්‍යාය දර්ශනයේ අන්තර්ගතවන බවයි. න්‍යාය සූත්‍රය නම් වූ ග්‍රන්ථයේ න්‍යාය දර්ශනය පිළිබඳ දත්ත සියල්ල ම අඩංගු වේ. මෙ ම ග්‍රන්ථය පරිශීලනය කිරීමෙන් තර්ක ක්‍රම,ප්‍රමාණ, අවයව,

අන්‍යමත පරීක්‍ෂා, දර්ශන පිළිබඳ දැනුම යන කරුණු සියල්ල අවබෝධ කර ගැනීමට හැකි වේ. මෙහි පදාර්ථ දහයක් විස්තර කර ඇත. එනම් ප්‍රමාණ, ප්‍රමේය, සංසය , ප්‍රයෝජන,දෘෂ්ටාන්ත, සිද්ධාන්ත, තර්ක, අවයව, නිර්ණය, වාද, ජලප, විතණ්ඩ, හේත්වාභාස, ජලප, ජාති, නිග්‍රහස්ථාන යනුවෙනි. මෙහි දැක්වෙන පරිදි සරල අදහස වන්නේ නිගමනය සඳහා වාදී ප්‍රතිවාදීන් විසින් කරුණු ඉදිරිපත් කිරීම වාදය යි. එක ම නිගමනයක් ලබා ගැනීමට විවිධ මතවල එල්බ සිටීමෙන් වාද ඇතිවේ. ප්‍රමාණ, තර්ක, සාධන ඉදිරිපත් කොට සිද්ධාන්තයට අවිරුද්ධ ව අවයව වාක්‍යයන් ගෙන් යුක්තව වාදී ප්‍රතිවාදීහු එක් කරුණක එල්බ සිටීම වාදය වේ.(15) එකම කරුණක් මුල් කරගෙන විවිධ මත ප්‍රකාශ වීම මෙහි දී කැපී පෙනේ. සර්ව දර්ශන සංග්‍රහයේ දැක්වෙන පරිදි තත්ව නිර්ණය ඵලය කොට පවත්වන කථා විශේෂය වාදය වේ.

චරක සංහිතාවේ වාදය අර්ථකථනය කරනුයේ මෙසේ ය. යම් මතයක් කරණකොට ගෙන ප්‍රතිවාදියෙකු සමඟ විග්‍රහකොට සම්භාෂා ස්වරූපයෙන් කථන කෙරේ ද එය වාදය යි. එම වාදය ජල්පය හා විතණ්ඩ යනුවෙන් දෙ ආකාර බව ද දක්වයි.

තත්‍ර වාදෝනාම ස යත් පරේණ සන
ශාස්ත්‍රපූර්වකං විගෘහ්‍ය කථයති ස ච
ද්වි විධ : සංග්‍රහේණ - ජල්පඃ විතංඩාච, (16)

එහි දැක්වෙන පරිදි පක්‍ෂය ආශ්‍රය කර ගෙන උභය වාදීන් විසින් යමක් කීම ජල්ප නමින් හඳුන්ව යි. බද්දේගම විමලවංස හිමියන් ජල්පය පිළිබඳව විස්තර කරනුයේ තර්ක සාධනය පිණිස සිද්ධාන්තයට අවිරුද්ධ ව පඤ්ච අවයව වාක්‍යයන් ගෙන් යුක්ත ව කරන කථාව ජල්ප වශයෙනි. දෙපක්‍ෂයක් එක් වී එකම කරුණක් තීරණය කිරීමේ කැමැත්තෙන් කරන කථාව යි. පරපක්‍ෂ දූෂණය හා ස්වපක්‍ෂ ස්ථාපනය ද මෙයින් බලාපොරොත්තු වෙයි. චරක සංහිතාව ජල්ප හා විතණ්ඩාව වාදයේ ප්‍රභේද ලෙස දැක්වූව ද න්‍යාය සූත්‍රයේ මේවා වෙන් වෙන් පදාර්ථ වශයෙන් නම් කර තිබේ.

චරක සංහිතාවේ සඳහන් වන ආකාරයට ජල්පයේ විපරිත තත්ත්වය විතණ්ඩාව යි. න්‍යාය භාෂ්‍යයේ දැක්වෙන පරිදි වාද, ජල්ප විතණ්ඩා යන 3 ම කථා විශේෂයන් ය. විතණ්ඩාවේ දී තම පක්‍ෂය තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරන වාක්‍යය ගැන නො සලකා පරපක්‍ෂය මැඩීම සඳහා කරුණු ඉදිරිපත් කරයි. තම පිළෙහි කරුණු ඉදිරිපත් කිරීමකින් තොර ව විරුද්ධ පක්‍ෂය ඉදිරිපත් කළ කරුණු බිඳීමෙන් ජය ලබා ගැනීමට උත්සාහ කරයි.

චරක සංහිතාවේ විස්තර කෙරෙන පරිදි වෛද්‍යවරයා විසින් වාද මාර්ග පද පිළිබඳ ව මනා දැනුමක් ලබා ගත යුතු යි. වාද මාර්ග පද නම්, වාදය, ද්‍රව්‍යය, ගුණය, කර්මය, සාමාන්‍යය, විශේෂය, සමවායය, ප්‍රතිඥාව, ස්ථාපනය, ප්‍රතිෂ්ඨාපනය, හේතුව, දෘෂ්ටාන්තය, උපනය, නිගමනය, උත්තරය, සිද්ධාන්තය, ශබ්දය, ප්‍රත්‍යක්‍ෂය, අනුමානයය, ඓතිහ්‍යය, ඖපම්‍යය, සංශයය, ප්‍රයෝජනය, ස්ව්‍යභිචාරය, ජිඥාසාව, ව්‍යවසාය, අර්ථප්‍රාප්තිය, සම්භාවය, අනුයෝජනය, අනනුයෝජ්‍යය, ප්‍රත්‍යනුයෝජ්‍ය, වාක්‍ය දෝෂය, වාක්‍ය ප්‍රශංසාව, ඡලය, හේතුව, අතීත කාලය, උපාලම්භය, පරිහාරය, ප්‍රතිඥාහානිය, අභ්‍යනුඥාව, හේත්වන්තරය, අර්ථාන්තරය, නිග්‍රහස්ථානය යන මේවා ය.

මෙම කරුණු අනුව පෙනී යන්නේ ආයුර්වේද වෛද්‍ය ශාස්ත්‍රයේ සිද්ධාන්ත ස්ථාපනයේ ලා භාරතීය තර්කය සුවිශේෂී මෙහෙවරක් සිදු කර ඇති බවයි.